# වාර්ෂික වාර්තාව
## 2012



ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# වාර්ෂික වාර්තාව
# 2012

# පටුන


| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම | 5 |
| 2. | සාමාන්‍ය ක්‍රියාකාරකම් | 6 |
| 3. | නව නිපැයුම් සංවර්ධන | 21 |
| 4. | පර්යේෂණ | 22 |
| 5. | පුහුණුව | 22 |
| 6. | ප්‍රවර්ධනය | 23 |
| 7. | වෙනත් ක්‍රියාකාරකම් | 26 |
| 8. | ප්‍රජා මූලික ක්‍රියාකාකරම් | 26 |
| 9. | කර්මාන්ත සම්බන්ධතා | 27 |
| 10. | මූල්‍ය හා පරිපාලන | 28 |
| 11. | වාර්ෂික ගිණුම් | 29 |
| 12. | වැදගත් සිදුවීම් | 49 |

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් 2012 වසර සඳහා නියමිත පරමාර්ථයන් ලඟාකරගැනීම උදෙසා රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන, ප්‍රදර්ශන සංචරණයට සහයවීම මූලික කරගනිමින් තම කාර්යය ඉටු කරගෙන යනු ලබයි. මහින්ද චින්තන දැක්ම සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්මට අදාලව ශ්‍රී ලංකා සංචරණයේ සමස්ථ පරිශ්‍රමය යෙදූ දායකත්වයක් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් ලබා දෙනු ඇත.

### දැක්ම

ශ්‍රී ලංකාව සතු මනබඳින වෙරළ හා අනූන සොබා සම්පත් හා සුහදශීලී සත්කාරවත් ජනතාව හා අප සංස්කෘතික උරුමයන් සමඟ සංචාරකයින් සඳහා අප ඉදිරිපත්කරන වැඩසටහන් තුළින් ආසියාවේ ප්‍රමුඛතම සංචාරක හා හරිත දිවයින බවට පත්කිරීම අපගේ ඉදිරි දැක්මයි.

ශ්‍රී ලංකාවේ ඉහත දැක්ම ලඟාකර ගැනීම සඳහා අසියාවේ සංචාරකයින් එක් ධජයක් යටතටගෙන ඒමත් විශාල විදේශ විනිමය සංචාරක කර්මාන්තයෙන් ලබාගැනීම සඳහා එහි ප්‍රතිලාභයන් ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ කොටස්කරුවන් සහ ජනතාව අතර බෙදී යාමටත් අවශ්‍ය කාර්යයන් ඇතිකල යුතු වේ.

### මෙහෙවර

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන සහ ප්‍රදර්ශන සංචරණය මඟින් ශ්‍රී ලංකාවේ රැස්වීම් කර්මාන්තය හරහා යැපෙන්නන්ගේ ජීවන තත්වය නගාසිටුවමින් ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා දෙන විදේශ විනිමයෙන් සුරක්ෂිත ඉහළ ආදායමක් ලබාගැනීමට කටයුතු කිරීම.

### 2012 රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන සහ ප්‍රදර්ශන සඳහා සංචාරක පැමිණීම්

| | |
|---|---|
| ජනවාරි | 8,475 |
| පෙබරවාරි | 7,519 |
| මාර්තු | 9,565 |
| අප්‍රේල් | 7,655 |
| මැයි | 6,325 |
| ජූනි | 6,850 |
| ජූලි | 10,840 |
| අගෝස්තු | 9,534 |
| සැප්තැම්බර් | 9,956 |
| ඔක්තෝබර් | 11,253 |
| නොවැම්බර් | 15,288 |
| දෙසැම්බර් | 16,300 |

මූලාශය - 2012 ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ පර්යේෂණ දත්ත අනුව 2006 වසරේ සිට රැස්වීම්, දිරිගැන්වීම, සම්මේලන සහ ප්‍රදර්ශන සඳහා සංචාරක පැමිණීම




## 2. සාමාන්‍ය ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ ක්‍රියාකාරකම් පුළුල් පරාසයකි. විවිධ ක්‍රමෝපායන් සමන්විතව රැස්වීම්, දිරිගැන්වීවේ චාරිකා, සම්මේලන, ප්‍රදර්ශන සහ සඳුවීම් වැනි විවිධ වූ ක්‍රියාකාරකම් 5 කි. ශ්‍රී ලංකාව රැස්වීම්, දිරිගැන්වීමේ චාරිකා, සම්මේලන සහ ප්‍රදර්ශන සඳහා සුදුසුම ස්ථානය බවට ප්‍රවර්ධන උදෙසාවන රාජ්‍ය අංශයේ ආයතනය ලෙස ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් එහි කාර්යයන් සිදුකරයි. පර්යේෂණ පුහුණුකිරීම්, ප්‍රවර්ධන් සහ විශේෂයෙන් සංචාරක ව්‍යාපාරය උදෙසා මිල විමසුම්, උපදේශනයන්, සැලසුම්කරණය, සංවිධානය, සම්මේලන සහ ප්‍රදර්ශන පැවැත්වීම සිදුකරමින් සිටි.

ඉන් ජාතික වැදගත්කමක් ඇති අවස්ථාවන් පහත දක්වා ඇත.

ආසියානු තරුණ ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවේ පැවැත්වීමට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් ලංසුව ලබාගෙන ඇත. කුවෙට් හී ජාතික ඔලිම්පික් කමිටුව සමඟ එක්ව මිල ගණන් ඉදිරිපත්කර ඇති අතර ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් ආසියානු ඔලිම්පික් කමිටු සභාපතිවන කුවෙට් ශේක් අල් අහමඩ් අල්සභා (Sheikh Al Almed Al Sabah) සමඟ ගිවිසුම අත්සන්කරමින් මැකවෝ හී පවත්වන ලද 31 වන රැස්වීමේ දී ඉදිරිපත්කිරීම් කර ඇත. ආසියානු තරුණ ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවේ පැවැත්වෙන විශාලතම ක්‍රීඩා උළෙලවනු ඇත.



**ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ පණිවිඩය**

දශක තුනක් අප රට වෙලාගෙන සිටි කුරිරු යුද්ධය අවසන් කර දැවැන්ත සංවර්ධන යුගයක් තුළින් ආසියාවේ ආශ්චර්ය බවට පත්වීමෙන්ද සංචාරක ව්‍යාපාරය මඟින් අප රටට ලැබෙන පිටුබලය අතිශයින් වැදගත්ය.

කාලය තුළ සංචාරක ව්‍යාපාරයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් සංචාරක ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට හේතුවන ක්‍රියාමාර්ග රැසක් රජය විසින් අනුගමනය කරනු ලැබිය. එම ක්‍රියාමාර්ගයන්ගේ සාර්ථක ප්‍රතිඵල නෙලාගැනීමට සාම්ප්‍රදායික සංචාරක ව්‍යාපාරයට පරිබාහිරව නව සංචරණ ක්‍රමෝපායන් පිළිබඳව විමසා බැලිය යුතු කාලය පැමිණ ඇත. ආගමික සංචරණය, සෞඛ්‍ය සංචරණය සහ විශේෂයෙන්ම ජාත්‍යන්තර සම්මේලන, සම්මන්ත්‍රණ සහ ජාත්‍යන්තර ප්‍රදර්ශන පැවැත්වීමට යෝග්‍ය ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව උද්දීපනය කිරීම සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනයට මෙන්ම ඒ තුළින් රටට ලැබෙන දායකත්වය ඉහළ නැංවීමට ද හේතු වේ.

සංචාරක කර්මාන්තය තුළ අන්තර් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩනගා ගැනීම තුළින් මෙම අරමුණු ජයගැනීමට ශ්‍රී ලංකා ප්‍රදර්ශන කාර්යංශයට හැකියාව ලැබේවායයි ප්‍රාර්ථනය කරමි.

**බැසිල් රාජපක්ෂ**
ගරු ආර්ථික සංවර්ධන අමාත්‍ය



**ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ**
**සභාපතිතුමාගේ පණිවිඩය**

මෙම වසරේ MICE සංචරණය ඉතා ස්ථාවරව සහ වාර්තාගත මට්ටමට පවත්වාගෙනයාමට තවදුරටත් හැකිවිය. ඒ සඳහා රටෙහි පැවති සාමකාමී වාතාවරණය පරිසරය, යටිතල පහසුකම් සංවර්ධනය හා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය ශ්‍රී ලංකා එයාලයින් සමාගම සහ ඒකාබද්ධව රුස්වීම් ක්ෂේත්‍රයේ සිදුකරන ලද ප්‍රවර්ධන වැදගත් විය.

රාජ්‍ය උපායමාර්ගයන් මත නව වෙළඳපලවල් ගොඩනැගීම සඳහා විශාල ප්‍රවර්ධන කාර්යයක් සිදුකිරීම තුළ ඉහළ සහභාගිත්වයක් සහිත MICE සංචාරකයින් ශ්‍රී ලංකාව තුළට යොමුවෙමින් සිටි. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය උපාය මාර්ගයන් ප්‍රවර්ධන කටයුතු ඇතිකරලමින් ශ්‍රී ලංකාව MICE ක්‍රියාකාරකම් සඳහා විශේෂිත ස්ථානයන් සහ දේශාන්තයන් බවට පත්කරලීම සිදුකරයි.

**නීල් රූපසිංහ**
**සභාපති**
ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය





2012 නොවැම්බර්හිදී මැකාවෝ හී පැවැති රැස්වීම

ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායම

2.1 යාපනය ජාත්‍යාන්තර වෙළඳ ප්‍රදර්ශනය 2012, ජනවාරි 20 - 22

හතරවන වතාවට පවත්වනලද මෙය Lanka Exhibition අයාතනය සමඟ එක්ව ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් දියත්කර ඇත.






2.2 අභ්‍යන්තරික රාජ්‍ය සමූහ රැස්වීම සහ තේ සම්මේලනය, 2012 ජනවාරි 30






2.3 Marati සම්මේලන 2012, පෙබරවාරි මස මහනුවරදී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ පවත්වන ලද ආගමික සම්මේලනය මෙය විය.




2.4 ‘ආරෝග්‍යා’ ජාත්‍යාන්තර සෞඛ්‍ය ප්‍රදර්ශනය සහ වෛද්‍ය සම්මන්ත්‍රණය, **BMICH** අගෝස්තු 17 - 19 (මූලික විධිවිධාන)



2.5 උතුරු ඉන්දියානු සාගර ජලමාන කොමිසමේ 12වන රැස්වීම




2.6 පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයේ 58 වන වාර්ෂික සම්මේලනය, කොළඹ, සැප්තැම්බර් 7 - 15

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් උපදේශය සහ සංවිධාන කටයුතු කරමින් එහි ප්‍රධාන කාර්යභාරය සිදු කර ඇත.



2.7 පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය ප්‍රධානීන්ගේ රැස්වීම 2013, සත්කාරකත්වය - ශ්‍රී ලංකාව



2011 ඔක්තෝබර් 28වන දින ඔස්ට්‍රේලියාවේ පර්ත් නුවරදී මහ රැජිණ විසින්
2011 පොදු රාජ්‍ය මන්ඩලීය රාජ්‍ය ප්‍රධානීන්ගේ රැස්වීම ආරම්භකරන ලදී.

2.8 37වන Kiwanis ආසියානු පැසිෆික් සම්මේලනය, 15 - 17 මාර්තු කොළඹ

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් එය ශ්‍රී ලංකාවේ පැවැත්වීමට එහි සංවිධායකයින් සමඟ එක්ව කාර්යයන් සිදුකරන ලදී.







2.9 **පොදු සෞඛ්‍ය කටයුතු පිළිබඳ ආසියා ශාන්තිකර සම්මේලනය, 2012 ඔක්තෝබර්**

මූලික වශයෙන් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය, වෛද්‍ය පීඨය හා එක්ව මෙම සම්මේලනය සඳහා 2008 වසරේ දී මිලගණන් ඉදිරිපත්කරන ලද අතර එහි 44වන සම්මේලනය 2012 වසරේදී ඉතා සාර්ථකව ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී.

පොදු සෞඛ්‍ය අංශයේ නියුතු වෘත්තිකයින් සහ පර්යේෂකයින් 100කට වැඩි පිරිසක් කොළඹට රැස්වූ අතර ඒ සඳහා ජාත්‍යන්තර නියෝජිතයින් 500කට වැඩි පිරිසක් සහභාගී විය.



## 2. 10 ළදරු බෝවන රෝග පිළිබඳ 6 වන ආසියානු සම්මේලනය, 2012 නොවැම්බර් 28 - දෙසැම්බර් 01

ළදරු බෝවන රෝග පිළිබඳ 6 වන ආසියානු සම්මේලනය මෑතකදී ශ්‍රී ලංකාවේ පැවැති විශාලතම වෛද්‍ය සම්මේලනය වන අතර ආසියා ශන්තිකර කලාපය පුරා පැතිර සිටින 1,000කට අධික ළදරු වෛද්‍ය වෘත්තිකයින්, පර්යේෂකයින්, ශාස්ත්‍රඥයින්, හෙදියන්, වෘත්තිකයින්, වෛරස පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්, වසංගත රෝග පිළිබඳ විශේෂඥයින් සහ බෝවන රෝග පිළිබඳ වෙනත් විශේෂඥයින් සහභාගී වන ලදී. එම සම්මේලනය ආරම්භයේ සිට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය එහි සංවිධායකයින් හා එක්ව කටයුතු කරන ලදී.




## 2.11 දකුණු ආසියානු කායික විද්‍යා වෛද්‍යවරුන්ගේ සංගමයේ 3 වන සම්මේලනය, 2012 දෙසැම්බර්

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් මෙම සම්මේලනය සාර්ථකව පැවැත්වීමට අවශ්‍ය සහය ලබාදෙන ලදී.





2.12 ASHRAE Chapter Regional සම්මේලනය, 2012 සැප්තැම්බර් 28 - 30

2.13 PMI ප්‍රාදේශීය සම්මේලනය, 2012 අප්‍රේල් 27






ව්‍යාපෘති කළමනාකරණය හරහා ජාතික සංවර්ධනය කඩිනම් කිරීම

2.14 ඉන්දියාවෙන් පැමිණි Ajanta Pharma සම්මේලන කණ්ඩායම



2.15 ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් පරිසර සංරක්ෂණය පිළිබඳ ජාත්‍යාන්තර සංවිධානයේ කිඹුලන් පිළිබඳ විශේෂඥ සමුළුව 2013 සඳහා මිල විමසුම ලබාගැනීම. එය 2013 මාර්තු 2013 BMICH හී දී පැවැත්වීමට නියමිතව ඇත.




2.16 “Amden Men” චිත්‍රපටය ප්‍රවර්ධනය



2.17 දකුණු ආසියානු වරායන් හා නාවුක ප්‍රදර්ශනය සහ සමුළුව



එය කොළඹ Cinnamon Grand හෝටලයේදී අප්‍රේල් 26 වන දින පවත්වන ලදී.

2.18 ඉන්දියානු අධ්‍යාපනික ප්‍රදර්ශනය, 2012 අප්‍රේල් 28 - 29




2.19 International Commission on Large Dams ICOLD සඳහා මිල විමසුම ඉදිරිපත් කිරීම.




2.20 දෙවන අභ්‍යන්තර Rhythm World Dance ශූරතාව





2.21 හතරවන ලංකා අභියෝගය - ත්‍රිවිල් අභියෝගය





2.22 තරුණ ක්‍රිස්තියානි සංගමයේ සම්මේලනය







2.23 Lupin Pharma සම්මේලනය 2012 ඔක්තෝබර් 12වන දින 800 දෙනෙකුගෙන් සමන්විත ඉන්දියානු කණ්ඩායම්



2.24 18 වන ආසියානු ශාන්තිකර තත්ව සම්මේලනය




ශාන්තිකර තත්ව සංවිධානයේ 18 වන ආසියානු ශාන්තිකර තත්ව සම්මේලනය 2012 ඔක්තෝබර් 14 - 17 දිනයන්හී ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී. විදේශ නියෝජිතයින් 160 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙම සම්මේලනය ඉතා සාර්ථකව පවත්වන ලද අතර සංචාරක ව්‍යාපාරයට පවා උපයෝගීවන පරිසරය රැකගනිමින් සම්පත් භාවිතය අවමකරගැනීමේ හැකියාව පිළිබඳ අවධානය යොමුකරමින් සංවර්ධිත රටවල් පවා ම බොහෝ සංවර්ධනයන් හී මුහුණපාන ප්‍රධාන ප්‍රශ්නයක් වන තිරසාර සංවර්ධන පිළිබඳ අවධානය යොමුකරන ලදී.



2.25 IATA Global Aviation Human සමුළුවල 2012 නොවැම්බර්

Global Aviation Human
Capital Summit




2.26 ආචාර ධර්ම සමාලෝචන කාරක සභාව සඳහා වන අසියානු සහ අපරදිග ජාත්‍යන්තර සම්මේලනයේ 12 වන සැසිය

ඉහත සැසිය 2012 නෙවැම්බර් 21 වන දින වොටර්ස් එජ් හෝටලයේ පැවැත්විය. ඒ සඳහා රටවල් 18 නියෝජිතයින් 300 දෙනෙකු සහභාගී විය. ඕස්ට්‍රේලියාව, බෙල්ජියම, බ්‍රිතානය, චීනය (90), ඉන්දියාවල ඉන්දුනීසියාව, ජපානය, මැලේසියාව, මියෙන්මාරය, නවසීලන්තය, පිලිපීනය, දකුණු කොරියාවල ශ්‍රී ලංකාව (100), තායිවානය (40), තායිලන්තය, මහා බ්‍රිතාන්‍ය, ඇමරිකාව සහභාගීවන ලදී.



ගම්මිරිස් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රජාවේ 40 වන සම්මේලනය

2.27 ගම්මිරිස් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රජාවේ 40 වන සම්මේලනය




ඉහත සම්මේලනය 2012 ඔක්තෝබර් 30 වන දින සිට නොවැම්බර් 02වන දින දක්වා ගල්කිස්ස මහ හෝටලයේදී පවත්වන ලද අතර බුද්ධිමතුන්, නිෂ්පාදකයින්, වෙළෙඳුන්, නිර්යාතකරුවන් සහ වෙනත් කැමැත්තක් දක්වන තම අදහස් හුවමාරුකරගැනීමට අපේක්ෂාකරන පාර්ශවයන්, වෙළඳපල සම්බන්ධකරමින් කටයුතුකරන්නන් සඳහා ඉතා හොඳ අවස්ථාවක් විය. 200 කට අධික ජාත්‍යන්තර හවුල්කරුවන් සහභාගීවන ලද අතර දේශීය ගම්මිරිස් කර්මාන්තය මෙන්ම වෙනත් කුළුබඩු කර්මාන්තයන්හී සාමාජිකයින් සඳහා අදහස් හුවමාරුකරගැනීමට සහ වෙනත් සංචාරක අංශයන් හරහා ශ්‍රී ලංකාව ප්‍රවර්ධන කිරීමට ලැබුනු අවස්ථාවක් විය.

2.28 ශ්‍රී ලංකාවේ පවත්වන ලද පිළිගත් ඒකාබද්ධ රැස්වීම්වලින් කිහිපයක්

ඉන්දියානු ඒකාබද්ධතා රැස්වීම් 2012

| ආයතනය | නියෝජිත | දිනය | ගණන |
|---|---|---|---|
| Johnson & Johnson කණ්ඩායම | Vivanta හෝටලය, බෙන්තොට | ජනවාරි | 27 |
| BASF South Asia Incentive රැස්වීම | Aitken Spence ආයතනය | පෙබරවාරි | 22 |
| Abbott Pharma | Vivanta හෝටලය, බෙන්තොට | පෙබරවාරි | 160 |
| TESCO | Vivanta හෝටලය, බෙන්තොට | පෙබරවාරි | 16 |
| Rediffusion Y&R | ටජ් සමුද්‍රා හෝටලය | පෙබරවාරි | 40 |
| Sonu Niiggam ප්‍රසංගය / Star Events | ටජ් සමුද්‍රා හෝටලය | පෙබරවාරි | 47 |
| Suntec සම්මේලනය | ටජ් සමුද්‍රා හෝටලය | පෙබරවාරි | 78 |
| Tesco Leadership Offsite | ටජ් සමුද්‍රා හෝටලය | පෙබරවාරි | 16 |
| IBM Senior Management Offsite | ටජ් සමුද්‍රා හෝටලය | මාර්තු | 47 |
| IIM Kolkata Reunion | ටජ් සමුද්‍රා හෝටලය | මාර්තු | 39 |
| BASF KTE සම්මේලනය | Aitken Spence ආයතනය | මාර්තු | 20 |
| BASF සම්මේලනය | ටජ් සමුද්‍රා හෝටලය | මාර්තු | 67 |
| | එකතුව | | 579 |

**වෙනත් රැස්වීම් සහ සමුළුවලින් කිහිපයක්**

| ආයතනය | නියෝජිත | දිනය | ගණන | රට |
|---|---|---|---|---|
| Azaq කණ්ඩායම | LSR | ජනවාරි 24 | 37 | සවුදි අරාබිය |
| පරිසර අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව | Taj Samudra හෝටලය | ජනවාරි | 87 | ආසියානු කලාපය |
| එංගලන්ත ඒ කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරය | Taj Samudra හෝටලය | පෙබරවාරි | 189 | එක්සත් රාජධානිය |
| Swiss Corporation | Taj Samudra හෝටලය | පෙබරවාරි | 25 | ස්විස්ටර්ලන්තය, ඉන්දියාවල නේපාලය, බංගලාදේශය, පකිස්ථානය, ඇෆ්ගනිස්ථානය |
| Iron Man 70.3 Sri Lanka Triathlon | Taj Samudra හෝටලය | පෙබරවාරි | 395 | ඇමරිකාව එක්සත් රාජධානය, ප්‍රංශය, ජර්මනිය, සිංගප්පූරුව, හොංකොං, ඔස්ට්‍රේලියාව, පිලිපීනය, ඉන්දියාව, ග්‍රීසිය, තුර්කිය, මැද පෙරදිග |
| Lanka Standard Institute (SLSI) | Taj Samudra හෝටලය | පෙබරවාරි | 114 | ස්විස්ටර්ලන්තය, පකිස්ථානය, කසකස්ථානය, කර්ගිස්ථානය, ඇසර්බයිජාන්, එස්ට්‍රියාව, අයර්ලන්තය, ඉරානය, |
| බ්‍රිතාන්‍ය කවුන්සලයේ සම්මේලනය | Taj Samudra හෝටලය | පෙබරවාරි | 74 | එක්සත් රාජධානිය, ඉන්දියාව |
| IPPAI (Independent Power Producers Association of India) ආසියානු බලශක්ති සමුළුව 2012 | Taj Samudra හෝටලය | පෙබරවාරි | 155 | ඉන්දියාව, මැද පෙරදිග |

| ආයතනය | නියෝජිත | දිනය | ගණන | රට |
|---|---|---|---|---|
| ICC T20 අනුග්‍රාහක සැසිය | Aitken Spence ආයතනය | පෙබරවාරි | 70 | මහා බ්‍රිතාන්‍ය |
| Tupperware දිරිගැන්වීමේ කණ්ඩායම | Aitken Spence ආයතනය | මාර්තු | 132 | බෙල්ජියම |
| රක්ෂණ සාමාගම් කණ්ඩායම | Tangerine චාරිකා ආයතනය | මාර්තු | 42 | බරෝඩා |
| රුසියානු දිරිගැන්වීම් | Vivanta, බෙන්තොට | මාර්තු | 34 | රුසියාව |
| Kiwaanis ASPAC ගිවිසුම් 2012 | Aitken Spence ආයතනය | මාර්තු | 385 | ආසියා ශාන්තිකර |
| එංගලන්ත කණ්ඩායම | Taj Samudra හෝටලය | මාර්තු | 641 | මහා බ්‍රිතාන්‍ය |
| කටාර් තානාපති කාර්යාලය,<br>හමුදා නියෝජිතයින් | Taj Samudra හෝටලය | මාර්තු | 81 | කටාර් |
| ADB නේවාසික සම්මේලනය | Taj Samudra හෝටලය | මාර්තු | 75 | ඉන්දියාව, ගිණිකොණදිග<br>ආසියානු ශාන්තිකර |
| එක්සත් රාජ්‍ය ජලමාන කාර්යාල | Taj Samudra හෝටලය | මාර්තු | 187 | මහා බ්‍රිතාන්‍ය |
| තරඟ නිළධාරීන් | Taj Samudra හෝටලය | මාර්තු | 62 | ඉන්දියාව, ශ්‍රී ලංකාව,<br>පකිස්ථානය, ඔස්ට්‍රේලියාව,<br>මහා බ්‍රිතාන්‍ය, දකුණු අප්‍රිකාව |
| ADB නාගරික සංවර්ධන වැඩසටහන | Taj Samudra හෝටලය | මාර්තු | 218 | ඉන්දියාව, ගිණිකොණදිග<br>ආසියාව, ශාන්තිකර |
| 12 වන උතුරු ඉන්දියානු සාගර<br>ජලමාන වැඩසටහන | Taj Samudra හෝටලය | මාර්තු | 71 | මහා බ්‍රිතාන්‍ය, ශ්‍රී ලංකාව |
| Expo 2012 ප්‍රදර්ශනය | Taj Samudra හෝටලය | මාර්තු | 248 | ඉන්දියාවල මැදපෙරදිග,<br>ආසියාව |
| Holcim වෙළඳ හමුව | Taj Samudra හෝටලය | මාර්තු | 222 | කලාපය |
| එකසත් ජාතීන්ගේ<br>සංයුක්ත ප්‍රාදේශීය රුස්වීම | Cinnamon Grand හෝටලය | නොවැම්බර් | 48 | ආසියාවල ඕසියානාව |
| ASOCIO සම්මේලනය | | නොවැම්´බර් | | |

2.29 – A separate Schedule is given in this report stating the events that took place in Conference Venues such as BMICH, SLECC Etc. This excludes the events held elsewhere in  hotels etc.

# 3 නව නිමැවුම් සංවර්ධනය

3.1 ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් හම්බන්තොට සම්මේලන ගොඩනැගිල්ලේ නිර්මාණ කටයුතු සහ වැඩකාර්යයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරියට සහය දක්වන ලදී.





3.2 ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් කොළඹල මීගමුවල වාද්දුව ප්‍රදේශයන්හී MICE සංචරණය සඳහා නව ස්ථාන ප්‍රවර්ධනයට සහයවීම.







3.3 ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සහය ඇතිව ඕලන්ද රෝහල් සංකීර්ණය ලෙස කලින් හැඳින්වූ ස්ථානය 'Court Yard' නමින් විනෝදාශ්වාදය සඳහා සුදුසු ස්ථානයක් ලෙස ස්ථාපිත කරන ලදී.








# 4 පර්යේෂණ

4.1 කාර්යාංශය විසින් 5,700 කට වඩා ඇතුලත් කිරීම් සහිත දත්ත ගබඩාවක් පවත්වා ගෙන යනු ලබයි.

4.2 කාර්යාංශය ව්‍යාපාර නියමුවන් සමග එක්ව කටයුතු කිරීම.

4.3 ශ්‍රී ලංකාවේ ජාත්‍යාන්තර සම්මේලන සංගමයේ සාමාජිකත්වය දරණ එකම ආයතනය වන ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් සාමාජිකත්වය අළුත්කරමින් අනාගත ප්‍රතිලාභ උදෙසා කටයුතු කරගෙන යනු ලබයි.

# 5 පුහුණුව

5.1 ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ ඉල්ලීම මත කොළඹ විශ්ව විද්‍යාල විසින් සංවරණ ඩිප්ලෝමාව සහ ශාස්ත්‍රවේ දී අධ්‍යයනයන් සඳහා එම විෂයය නිර්දේෂයන්ට රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන, ප්‍රදර්ශන පිළිබඳව ඉගැන්වීමට විෂයක් ලෙස ඇතුලත් කරන ලදී.

5.2 ශ්‍රී ලංකා සංචාරක සම්මුති කාර්යාංශය විසින් රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන, ප්‍රදර්ශන පිළිබඳ වෘත්තීය සංවර්ධන වැඩසටහන 2012 ජුනි 30 වන දින වයික්කාල් හිදී පවත්වන ලදී.





දහ වන රැස්වීම් දිරිගැන්වීම් සම්මේලන ප්‍රදර්ශන පිළිබඳ වෘත්තීය සංවර්ධන වැඩසටහන

# 6 ප්‍රවර්ධනය

## 6.1 ප්‍රචාරය

### 6.1.1 Kompass ප්‍රචාරාත්මක වැඩසටහන




### 6.1.2 TTG Asia Pacific ලිපි අතිරේකය

TTG ASIA

## 6.2 ප්‍රවර්ධන අමුද්‍රව්‍ය














**ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් පහත සඳහන් ප්‍රවර්ධන අමුද්‍රව්‍ය පවත්වාගෙන යනු ලබයි.**

- සංස්ථාපිත අනන්‍යතාව (CD තැටි)
- සංස්ථාපිත අනන්‍යතාවය මුද්‍රිත මාධ්‍ය
- රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලනල ප්‍රදර්ශන පිළිබඳ චිත්‍රපට
- රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන, ප්‍රදර්ශන පිළිබඳ චිත්‍රපටය - මීගමුව
- පත්‍රිකා
- රැස්වීම් සැලැස්ම
- ත්‍යාග
- Jetliner සඳහා නව විස්තර පත්‍රිකාව
- රාමායනය සඳහා නව විස්තර පත්‍රිකාව

රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන, ප්‍රදර්ශන පිළිබඳ (MICE) සංචරණය සඳහා නව DVD සැකසීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

## 6.3 රට හඳුනාගැනීමේ චාරිකා

6.3.1 Abacus International හී නිළධාරීන් සඳහා රට හඳුනාගැනීමේ චාරිකා සම්පාදනය කිරීම, 2012 ජනවාරි

6.3.2 සෝනු නිගම් ප්‍රමුඛ කණ්ඩායම වෙනුවෙන් රට හඳුනාගැනීමේ චාරිකාව - මහනුවර සහ පින්නවල 2012 පෙබරවාරි.






6.3.3 ඉන්දියානු රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන, ප්‍රදර්ශන පිළිබඳ (MICE) මෙහෙයවන්නන් සහ දිල්ලිල බොම්බාය, බැංගලෝරය සහ චෙන්නායි හී මාධ්‍යවේදීන් සඳහා 2012 ඔක්තෝබර් 29 සිට නොවැම්බර් 2 දක්වා සංවිධානය කරන ලද චාරිකාව



ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සාමාන්‍යාධිකාරි උත්සවය අමතමින්

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය Sri Lankan Air Lines සහ සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන් විසින් 60කට අධික රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන, ප්‍රදර්ශන මෙහෙයවන්නන් ඉන්දියානු මාධ්‍ය සඳහා සත්කාරකත්වය ලබාදෙන ලදී. රැස්වීම්, දිරිගැන්වීම්, සම්මේලන, ප්‍රදර්ශන පිළිබඳ සංචරණය සඳහා පවතින්නේ ප්‍රාථමික වෙළඳපලක්වන අතර ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් එම වෙළඳ පල ප්‍රවර්ධනය කිරීම නොකඩවා ඉදිරියටත් සිදුකරනු ඇත.

## 6.4 විදේශ ප්‍රවර්ධනය

විදේශයන්හී MICE සංචරණය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් සඳහා සහභාගීවීම.

6.4.1 බොම්බෙ - ඉන්දියාව නිමකර ඇත.




6.4.2 GIBTM - අබුඩාබි නිමකර ඇත.




6.4.3 IMEX ෆැන්ක්ෆර්ට් නිමකර ඇත.

## 6.5 වෙබ් අඩවියට අදාල ප්‍රවර්ධන

6.5.1 www.visitssrilanka.net දෛනික යාවත්කාලීන කිරීම

6.5.2 BBT සඟරාවේ කටයුතු

6.5.3 MICE Point සඟරාවේ කටයුතු

6.5.4 අදාල වෙබ් අඩවිවල ශ්‍රී ලංකා MICE සංවරණයය අදාල මාධ්‍ය දැනුවත් කිරීම් පිළිබඳ අවධානය.

ForImmediateRelease.Net

Travel News Distribution powered by eTurboNews:

International Council of Tourism Partners welcomes Sri Lanka Convention Bureau
July 20, 2012 in Destinations

ICTP

(Forimmediaterelease.net) HALEIWA, Hawaii, USA; BRUSSELS, Belgium; VICTORIA, Seychelles – The International Council of Tourism Partners (ICTP) announced that the Sri Lanka Convention Bureau (SLCB) has become the second destination member from the country.

The mission of the Sri Lanka Convention Bureau is to position Sri Lanka internationally as a unique venue for MICE activities, resulting in revenue from MICE tourism that will make a positive contribution to Sri Lanka's economy. This will also create jobs and uplift the standards of those engaged in the MICE industry.

# 7 වෙනත් ක්‍රියාකාරකම්

7.1 චීන පෙළඹවීමේ චාරිකා වෙනුවෙන් ගාලු කෞතුකාගාරය තුළ Fa Hien and Zheng Ho Chamber සංවර්ධනය කිරීම.





7.2 නෙතදර ජායාරූප ප්‍රදර්ශනය




## 8. ප්‍රජා මූලික වැඩසටහන්

8.1 2012 ජුනි 4 වන දින පොසොන් පොහොය වෙනුවෙන් අයිස් ක්‍රීම් දන්සැලක් අනුරාධපුර දී පවත්වන ලදී.

8.2 අභයගිරිය නැවත ඉදිකිරීමේ වැඩසටහනට සහභාගී වීම




# 9 කර්මාන්ත සම්බන්ධතා



මීගමුවේ දී පැවැති ශ්‍රී ලංකා  වෘත්තීය සම්මේලන ප්‍රදර්ශන සහ ක්‍රියාකාරකම් සංවිධායකයින්ගේ සංගමයේ වාර්ෂික මහා රැස්වීම 2012 සැප්තැම්බර්

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය, ශ්‍රී ලංකා වෘත්තීය සම්මේලන, ප්‍රදර්ශන සහ ක්‍රියාකාරකම් සංවිධායකයින්ගේ සංගමය (SLAPCEO) කර්මාන්තයේ සංවර්ධනය උදෙසා ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරිත්වයන් හරහා එක්ව කටයුතු කර ඇත.

## 9.1 MICE සංචරණයේ සාමාජිකයින් සඳහා දේශන



2014 දක්වා ඉදිරි වර්ෂ සඳහා අපේක්ෂිත විදේශ ප්‍රවර්ධන කටයුතු පිළිබඳ MICE සංචරණ සාමාජිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් පවත්වන ලදී.

ඒ සඳහා සහභාගී වූවන්ගේ අදහස් අනුව ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ අලෙවිකරණ සැලැස්ම නිර්මාණය කරන ලදී.

# 10. මූල්‍ය සහ පරිපාලන

10.1 අවශ්‍යතාවයන්ට අනුව ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් මහින්ද චින්තන වාර්තාවල කාර්යය සාධන වාර්තාවල සාමාන්‍ය කාර්යයසාධන සහ ප්‍රගති වාර්තාව ක්‍රියාකාරි සැලැස්මල ක්‍රියාකාරකම් සැලැස්ම ඉදිරිපත්කර ඇත.

10.2 විගණන වාර්තා මෙන්ම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට අදාල වාර්තා ඉදිරිපත්කර ඇත.

10. 3 වර්තමාන කාර්යය මණ්ඩලය

නීල් රූපසිංහ මහතා, සභාපති (2012 ජුනි 01 සිට) අචාර්යය නාලක ගොඩහේවා මහතා, සභාපති (2010 ජුනි 15 සිට 2012 ජුනි 01)

විපුල වනිගසේකර මහතා, සාමාන්‍යාධිකාරි

අචිනි දන්දුන්නගේ මහත්මිය, ජ්‍යේෂ්ඨ කළමනාකරු (මෙහෙයුම්)

කුමුදු හෙන්නදිගේ මහත්මිය, අලෙවි කළමනාකරු

රංජිකා පෙරේරා මහත්මිය, සහකාර කළමනාකරු (ගිණුම් සහ පරිපාලන)

ශකිලා තලගල මෙනවිය, ලේකම්, සම්බන්ධීකාරක

සංජීව පෙරේරා, රියදුරු

10.4 කාර්යාංශය හා ශ්‍රී ලංකන් ගුවන් සේවාව (Sri Lankan Air Lines) සමඟ එකාබද්ධව මිලියන 2ක් වටිනා ටිකට්පත් සඳහා ප්‍රවර්ධන වැඩසටහනග

10.5 සම්මුති කාර්යාංශයේ සමාන්‍යාධිකාරි එම තනතුරට අමතරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වැඩ බලන අධ්‍යක්‍ෂ ජනරාල් ලෙස ද කටයුතු කරනු ලබයි.

**විපුල වනිගසේකර**
**සාමාන්‍යාධිකාරි**

# පටුන


| | පිටු අංකය |
|---|---|
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 1 |
| ආදායම් ප්‍රකාශය | 2 |
| හිමිකම් ප්‍රකාශයේ වෙනස්වීම් | 3 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 4 |
| ගිණුම්වලට අදාල සටහන් | 5 - 22 |

# ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
## 2012 දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් සහ බැංකු ශේෂයන් | 8 | 53,692,223.76 | 35,177,323.28 |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් | 9 | 20,837,297.16 | 24,662,899.63 |
| පූර්ව ගෙවීම් | 10 | 5,301,904.00 | 12,995,759.93 |
| තැන්පතු | 11 | 80,000.00 | 55,000.00 |
| රඳවා ගැනීමේ බදු වැට් ලැබිය යුතු | | 450,553.57 | 450,553.57 |
| **මුළු ජංගම වත්කම්** | | **80,361,978.49** | **73,341,536.41** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| **දේපල, පිරියත හා උපකරණ** | 12 | 10,281,255.65 | 9,905,459.96 |
| **අඩුකලා - ක්ෂය වෙන්කිරීම්** | | 8,585,049.53 | 7,101,779.11 |
| **ලියාහැරීම්වල වටිනාකම** | | **1,696,206.12** | **2,803,680.85** |
| එකතුකලා - නොනිමි වැඩ | | | |
| දිගුකාලීන ආයෝජන | | - | - |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 1,696,206.12 | 2,803,680.85 |
| **මුළු වත්කම්** | | **82,058,184.61** | **76,145,217.26** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියන් | 13 | 58,949.34 | 4,323,187.94 |
| උපචිත වියදම් | 14 | 1,070,155.56 | 638,275.94 |
| විශ්‍රාමයාම්, පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 954,007.00 | 804,425.00 |
| මුළු ජංගම වගකීම් | | 2,083,111.90 | 5,765,888.88 |
| ශුද්ධ වත්කම් | | **79,975,072.71** | **70,379,328.38** |
| **ශුද්ධ වත්කම්/ හිමිකම** | | | |
| ආරම්භක ශේෂ හිමිකම් | | 6,433,492.69 | 6,433,492.69 |
| රඳවාගත් ආදායම් | 15 | 51,837,379.69 | 55,896,331.02 |
| වසර සඳහා ලාභය | | 21,704,200.33 | 8,049,504.67 |
| **මුළු ශුද්ධ වත්කම්/ හිමිකම** | | **79,975,072.71** | **70,379,328.38** |

| | |
|---|---|
| ........................................ | ........................................ |
| නීල් රූපසිංහ | විපුල වනිගසේකර |
| සභාපති | සාමාන්‍යාධිකාරී |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය |

# ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

## ආදායම් ප්‍රකාශය

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා

| | සටහන | 2012<br>(රු.) | 2011<br>(රු.) |
|---|---|---|---|
| ආදායම | | | |
| අපගමන බදු | | 60,878,416.91 | 41,667,139.27 |
| සංචාරක සංවර්ධන බදු | | 25,883,991.03 | 25,990,827.91 |
| වෙනත් ආදායම් | 16 | 2,863,863.19 | 2,814,863.37 |
| **මුළු ආදායම** | | **89,626,271.13** | **70,472,830.55** |
| | | | |
| වියදම් | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 17 | 6,334,958.35 | 7,157,465.78 |
| සැපයුම් සහ පාරිභෝගික භාවිතයන් | 18 | 2,985,692.09 | 3,816,528.74 |
| වෙළඳ සම්බන්ධිත වියදම් | 19 | 37,227,379.79 | 47,898,312.49 |
| පර්යේෂණ සහ සංවර්ධන | 20 | 3,251,075.36 | 1,813,162.68 |
| ක්ෂය හා ක්ෂය වෙන්කිරීම් සංචිත | | 1,483,270.42 | 1,441,520.98 |
| වෙනත් වියදම් | 21 | 644,600.00 | 261,600.00 |
| මූල්‍ය වියදම් | 22 | 7,144.80 | 34,735.21 |
| පූර්ව වසර සඳහා ගැලපුම් | 6 | 15,987,949.99 | - |
| **මුළු වියදම්** | | **67,922,070.80** | **62,423,325.88** |
| | | | |
| **කාලපරිච්ඡේදයට අතිරික්ත / (ඌනතා)** | | **21,704,200.33** | **8,049,504.67** |

## සටහන 15

## ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා හිමිකම් ප්‍රකාශයේ වෙනස්කම්

| විස්තරය | රඳවාගත් ඉපැයුම් | ප්‍රාග්ධන වෙන්කිරීම් | එකතුව |
|---|---|---|---|
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 63,945,835.69 | 6,433,492.69 | 70,379,328.38 |
| වසර සඳහා ලාභය | 21,704,200.33 | | |
| මහා භාණ්ඩාගාරයට සිදුකල මුදල් මාරුකිරීම් | 12,108,456.00 | | |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 73,541,580.02 | **6,433,492.69** | **79,975,072.71** |

# ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
# මුදල් ප්‍රවාහ ප්‍රකාශය 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා

| | | |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය | | |
| ශුද්ධ අතිරික්ත/ (ඌනතා) බදු ගෙවීමට පෙර හා විශේෂ අයිතමයන් | | 21,704,200.33 |
| **ගැලපුම්** | | |
| ක්ෂයවීම් | 1,483,270.42 | |
| සේවක ණය සහ තැන්පතු පොළී | (31,863.19) | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 149,582.00 | 1,600,989.23 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්ත / (ඌනතා)** | | **23,305,189.56** |
| | | |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගලාඒම් / ගලායාම්** | | |
| | | |
| (වැඩිවීම්)/ අඩුවීම් වෙළඳ අයවිය යුතු | 3,825,602.47 | |
| (වැඩිවීම්)/අඩුවීම් පූර්ව ගෙවීම් | 7,693,855.93 | |
| වැඩිවීම්/(අඩුවීම්) වෙළඳ ගෙවිය යුතු | 4,264,238.60 | |
| වැඩිවීම්/ (අඩුවීම්) උපචිත වියදම් | 98,835.61 | |
| වැඩිවීම්/(අඩුවීම්) තැන්පතු | (25,000.00) | 15,857,532.61 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මුදල් ප්‍රමාණය** | | 39,162,722.17 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් හී මූල්‍ය ප්‍රවාහය** | | |
| | | |
| සේවක ණය තැන්පතු පොළිය | 31,863.19 | |
| දේපල, පිරියත හා උපකරණ | (375,795.69) | |
| බැංකු පොළී ලැබීම් | | (343,932.50) |
| **ශද්ධ මුදල් යෙදවුම් ආයෝජන ක්‍රියාකාරකම්** | | (93,136.63) |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් හී මූල්‍ය ප්‍රවාහය** | | |
| අඩුකලාඃ රඳවාගත් ඉපැයුම් | (4,058,951.33) | (4,058,951.33) |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් හී මුදල් ප්‍රමාණය** | | (4,058,951.33) |
| | | |
| මුදල් හා මුදල් සමාන ඉපැයුම් වල ශුද්ධ වටිනාකම් පහළයාම | | 35,010,634.21 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන ඉපැයුම් (සටහන 2) | | 35,177,323.28 |
| කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන ඉපැයුම් (සටහන 1) | | 53,692,223.76 |

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්

**සටහන 01**

| | |
|---|---|
| මුදල් හා මුදල් සමාන දෑ හී සංයුතිය | |
| බැංකු සහ අතැති මුදල් | 35,177,323.28 |
| | 35,177,323.28 |

**සටහන 02**

| | |
|---|---|
| 2012.01.01 දිනට ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ මුදල් ශේෂය | 35,177,323.28 |
| 2012.01.01 දිනට මුදල් ශේෂය | 53,692,223.76 |

## ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
## ගිණුම් සටහන්
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා

### 01. සමාන්‍ය තොරතුරු
### ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය 2005 අංක 38 දරණ සංචාරක පනත යටතේ ස්ථාපිතකර ලියාපදිංචිකර ඇත. ප්‍රධාන කාර්යාලය කොළඹ 03, ගාලු පාරේ අංක 78 දරණ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ හතරවන මහලේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් සම්මේලන, එකාබද්ධ රැස්වීම්, සංචාරකයින් ගෙන්වාගැනීම්, දිරිගැන්වීම් සහ ප්‍රදර්ශන ප්‍රවර්ධන කටයුතු සිදුකරනු ලබයි.

### 02. ගිණුම්මය ප්‍රතිපත්තීන් සහ සකස්කිරීමේ පදනම

සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතීන් හී 1.1 වගන්තියට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ඉන් නිදහස් ආයතනයක් නොවන හෙයින් ඊට යටත්ව මූල්‍ය ප්‍රකාශයන් සකස්කර ඇත.

### 03. සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතීන් පැහැදිලිකිරීම

සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතීන්ට අනුකූලව සකස්කරන ලද මූල්‍ය ප්‍රකාශයන් ලෙස 2012 වසර සඳහා වන මෙම මූල්‍ය ප්‍රකාශයන් දැක්විය හැක. සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතීන්ට මාරුවී ඇත්තේ 2011 ජනවාරි 01 දින සිටය. අවසන් මූල්‍ය ප්‍රකාශයන් සකස්කර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිතීන්ට අනුකූලව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහාය.

### 04. දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ ගිණුම සකස්කරඇත්තේ එහි ඓතිහාසික පිරිවැය වන මිලටගත් අවස්ථාවේ පැවැති පිරිවැය හෝ ඉදිකිරීම් පිරිවැය මතයග

ක්ෂයවීම් පිරිවැය අයිතිකාරත්වයේ කාලපරිච්ඡේදයට අනුව පෙන්වා දී ඇති අතර ක්ෂය ගණනය පහත දක්වා ඇත.

| වත්කම් | අනුපාතය |
|---|---|
| කාර්යාල උපකරණ | 10% |
| මෝටර් රථ | 25% |
| ලී බඩු සහ සවිකිරීම් | 10% |

### 05. වගකීම් සහ වෙන්කිරීම්

ශේෂ පත්‍රයේ දිනට සකස්කර ඇති සෑම ප්‍රමාණාත්මක වගකීමක්ම ගිණුම්වල සඳහන් කර ඇත.

### 06. විශ්‍රාමික ප්‍රතිලාභ

1983 අංක 12 දරණ පරිතෝෂික ගෙවීමේ පනත යටතේ විශ්‍රාමික ප්‍රතිලාභගෙවීම සඳහා විධිවිධාන සකස්කර ඇත, අවසන් ප්‍රතිලාභ සකස්කර ඇත්තේ වර්තමාන වැටුප් තලයේ මාසික වැටුපෙන් භාගයක් වන පරිදිවේ.

### 07. පෙර වසර සඳහා ගැලපුම්

2012 වසරේදී පූර්ව ගැලපුම් සිදුකර ඇති අතර 2010 සිට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු අපගමන බදු සහ සංචාරක සංවර්ධන බදු සඳහා වෙන්කිරීම් කර ඇත. 2012 හා සැසඳීමෙන් පසු 2012 වසරේ ගිණුම් සඳහා නිවැරදි අගයන් ලබාගෙන ඇති අතර අයවියයුතු අගයන් නිවැරදිකිරීම සඳහා පූර්ව වසරේ ගැලපුම් වලින් ශේෂ අගය ලියාහැර ඇත.

## ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
## මූල්‍ය ප්‍රකාශයන් සඳහා සටහන්
## 2012 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන්වන කාලපරිච්ඡේය සඳහා

**08.** බැංකුගත සහ අතැති මුදල්

| අයිතම | **2012 ( රු.)** | **2011 ( රු.)** |
|---|---|---|
| බැංකුගත මුදල් - ලංකා බැංකුව | 46,843,880.56 | 31,388,275.28 |
| බැංකුගත මුදල් - මහජන බැංකුව | 6,828,343.20 | 3,789,048.00 |
| සුළු මුදල් ආග්‍රිමය | 20,000.00 | - |
| අතැති මුදල් එකතුව සහ බැංකු ශේෂය | 53,692,223.76 | 35,177,323.28 |

**09.** වෙළඳ සහ වෙනත් ලැබීම්

| අයිතම | **2012 ( රු.)** | **2011 ( රු.)** |
|---|---|---|
| සේවක ණය | 636,013.83 | 861,977.79 |
| උත්සව අත්තිකාරම් | 1,000.00 | 2,000.00 |
| ලංකා ප්‍රදර්ශන සහ සම්මේලන සේවා | - | 39,200.00 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 20,170,673.33 | 23,730,111.84 |
| චාරිකා සහ සංචාරක කළමනාකරණ ආයතනය | 450.00 | 450.00 |
| සංචාරක අමාත්‍යාංශය | 29,120.00 | 29,120.00 |
| සන්වේ හොලිඩේස් (Sunway Holidays) | 1,800.00 | 1,800.00 |
| ටැංජරින් ටුවර්ස් (Tangerine Tours) | (1,760.00) | (1,760.00) |
| එකතුව | 20,837,297.16 | 24,662,899.63 |

**10.** පූර්ව ගෙවීම්

| අයිතම | **2012 ( රු.)** | **2011 ( රු.)** |
|---|---|---|
| ප්‍රවර්ධනය සඳහා ගෙවීම් | 4,700,644.63 | 9,843,914.21 |
| රක්‍ෂණ | 110,449.26 | 98,843.06 |
| කාර්යාල උපකරණ නඩත්තු | 490,810.11 | 357,978.56 |
| GIBTM ඉඩ අවකාශය සඳහා පිරිවැය | - | 2,695,024.10 |
| **එකතුව** | **5,301,904.00** | **12,995,759.93** |

**11.** තැන්පතු

| අයිතම | **2012 ( රු.)** | **2011 ( රු.)** |
|---|---|---|
| ශ්‍රී ලංකා ටෙලිකොම් | 5,000.00 | 5,000.00 |
| C F ද මෙල් සහ පුත්‍රයෝ | 75,000.00 | 50,000.00 |
| අතැති මුදල් එකතුව සහ බැංකු ශේෂය | **80,000.00** | **55,000.00** |

## දේපල, පිරියත සහ උපකරණ

**සටහන් අංක 2 A**

| සටහන | සංකේතය | විස්තරය | 2012.01.01 දිනට ශේෂය | අමතර අගය 2012 | මාරුකිරීම් 2012 | 2012.12.31 දිනට ශේෂය | 2012ග12ග31 දිනට උපචිත ක්ෂයවීම් | ක්ෂයවීම්' 2012ග12ග31 | 2012.12.31 දිනට උපචිත ක්ෂයවීම් | 2012.12.31 දිනට ශුද්ධ පොත් අගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3.1 | 101 | කාර්යාල උපකරණ | 5,297,992.69 | 158,977.60 | | 5,456,970.29 | 4,895,345.74 | 542,102.27 | 5,437,448.01 | 19,522.28 |
| 3.2 | 103 | ලී බඩු සහ සවිකිරීම් | 728,967.27 | 216,818.09 | | 945,785.36 | 715,402.12 | 79,543.15 | 794,945.27 | 150,840.09 |
| 3.3 | 110 | මෝටර් රථ | 3,158,500.00 | - | | 3,158,500.00 | 987,031.25 | 789,625.00 | 1,776,656.25 | 1,381,843.75 |
| 3.4 | 111 | මෘදුකාංග | 720,000.00 | - | | 720,000.00 | 504,000.00 | 72,000.00 | 576,000.00 | 144,000.00 |
| | | උප එකතුව | 9,905,459.96 | 375,795.69 | | 10,281,255.65 | 7,101,779.11 | 1,483,270.42 | 8,585,049.53 | 1,696,206.12 |

**13. ණයහිමියන්**

| අයිතම | 2012 (රු.) | 2011 (රු.) |
|---|---|---|
| මොබිටෙල් පුද්ගලික සමාගම | 12,535.24 | 12,740.10 |
| American Premium Water ආයතනය | 1,214.63 | 1,461.39 |
| දකුණු කොළඹ සමුපකාර සංගමය | 11,948.00 | - |
| Sealcine ආයතනය | - | 285,742.80 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සුභ සාධක සංගමය | 7,375.00 | 3,834,487.89 |
| ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය | 21,313.59 | 21,097.02 |
| ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය | | 98,469.12 |
| Suntel ආයතනය | 4,562.88 | 3,790.87 |
| C.F ද මෙල් සහ පුත්‍රයෝ | - | 17,598.75 |
| Jetwing Travels / Tecno Forms ආයතන | - | 47,800.00 |
| **එකතුව** | **58,949.34** | **4,323,187.94** |

**14. උපචිත වියදම්**

| අයිතම | 2012 ( රු.) | 2011 ( රු.) |
|---|---|---|
| කාර්ය මණ්ඩලය සඳහා - ගෙවිය යුතු | 333,044.01 | 241,045.00 |
| රඳවාගැනීමේ බදු - ගෙවිය යුතු | 16,975.00 | 16,975.00 |
| Vat ගෙවිය යුතු | - | 70,510.00 |
| සේවක අර්ථසාධක අරමුදල - ගෙවිය යුතු | 150,336.49 | 57,770.01 |
| සේවක භාරකාර අරමුදල - ගෙවිය යුතු | 11,162.13 | - |
| ආදායක ගෙවිය යුතු | 2,289.00 | (138.00) |
| Phoenix Ogilvy | 1,785.93 | 1,785.93 |
| SRL ගෙවිය යුතු | - | 328.00 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | 144,563.00 | - |
| ව්‍යවහාරික සංඛ්‍යායන ආයතනය | - | 250,000.00 |
| රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව | 410,000.00 | - |
| **එකතුව** | **1,070,155.56** | **638,275.94** |

**16.** වෙනත් ආදායම්

| අයිතම | 2012 (රු.) | 2011 ( රු.) |
|---|---|---|
| පොලී ආදායම (සේවක ණය) | 31,863.19 | 26,188.63 |
| බැංකු පොලී | - | 108,674.74 |
| වෙනත් ආදායම් (සහභාගීවීම වෙනුවෙන් ගාස්තු) | 2,832,000.00 | 2,680,000.00 |
